# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2307/66 – 2022 නොවැම්බර් 25 වැනි සිකුරාදා – 2022.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

1972 අංක 18 සහ 1974 අංක 29 දරන අර්ථ නිරූපන (සංශෝධිත පනත්වලින් සංශෝධිත අර්ථ නිරූපන ආඥාපනතේ (12 වන අධිකාරය) 18 වැනි වගන්තියට අනුකූලව සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම අංක 2267/59 හා 2022.02.18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 39අ (1) වැනි වගන්තිය යටතේ නියමය මෙයින් අවලංගු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 03/J/84/LG/256 1 & II.
අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: ME/ACQ/F/763.
2022 නොවැම්බර් මස 11 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 11 - 0305

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 467/34 හා 1987.08.17 වැනි දින දරන *රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 1987 අංක 290 හා 1987.08.10 වැනි දින දරන ආඥාවේ පහත සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 467/34 හා 1987.08.17 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 1987 අංක 290 දරන ආඥාවේ යටතේ පළ කරන ලද පහත සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 03/J/84/LG/256 I & II.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: ME/ACQ/F/763.
2022 නොවැම්බර් මස 11 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, සුදුවැල්ල (කලාප අංක 24, කොළඹ මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.කො.7963 හා 1998.09.10 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0051 ක් වන ඩීන්ස් පාරේ වරි. අංක 464 නැමති ඉඩම් කැබලි 02 (දෙකට) මායිම්:

01. **කැබලි අංක 98 1/2 – ඩීන්ස් පාරේ වරි. අංක 464 – ප්‍රමාණය: හෙක්. 0.0003 ක් පමණ**

උතුරට: මු.පි.කො 7653 හි කැබලි අංක 93, මෙම පිඹුරේ 94 සහ 95; නැගෙනහිරට: කැබලි අංක 95 සහ 97 1/2; දකුණට: කැබලි අංක 98 2/2; බටහිරට: ඩීන්ස් පාරේ වරි. අංක 464.

02. **කැබලි 98 2/2 – ඩීන්ස් පාරේ වරි. අංක 464 – ප්‍රමාණය: හෙක්. 0.0048 ක් පමණ**

උතුරට: ඩීන්ස් පාරේ වරි. අංක 464 සහ කැබලි අංක 98 1/2, 97 1/2; නැගෙනහිරට: කැබලි අංක 97 2/2; දකුණට: කැබලි අංක 100, 99 සහ 102; බටහිරට: ඩීන්ස් පාරේ වරි. අංක 464.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, සුදුවැල්ල (කලාප අංක 24, කොළඹ මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.කො.7653 හා 1995.11.11 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0118 ක් වන ඩීන්ස් පාරේ වරි. අංක 464 (කොටසක්) නැමති ඉඩම් කැබැල්ලට (01) මායිම්:

03. **කැබලි අංක 96 – ඩීන්ස් පාරේ වරි. අංක 464 කොටසක් – ප්‍රමාණය: හෙක්. 0.0118 ක් පමණ**

උතුරට: වරි. අංක 452 සහ කැබලි අංක කැබලි අංක 92 සහ 93; නැගෙනහිරට: කැබලි අංක 94 සහ 95; දකුණට: කැබලි අංක 97 සහ 98; බටහිරට: වරි. අංක 525 යුනියන් පෙදෙස සහ ඩීන්ස් පාරේ වරි. අංක 464 ඩීන්ස් පාර.

11 - 306

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.